# තරු පායන මෙල්බර්න් අහස
# BE MY VALENTINE 2018







මෙල්බර්න් පුරවරයට Swan Entertainment විසින් අස්වැද්දු,සිංහල ගී කෙතේ අස්වැන්න නෙළු කාළය වසර දහයක පමණ අතීතයකට දිව යන්නක්.දසවස් පූර්ණ ඒ කාල හෝරාවන් තුළ, තරු එළියේ නිවි සැනසුන මෙල්බර්න් හදවත් බොහොමයක් ඒ අතීතය ආවර්ජනය කරන්නේ ඉමහත් සතුටිනි.

සිංහල ගී රසයට හුරු රසිකයින් සේම නව රසික පරපුරක් සිංහල ගීතයට හුරු කරමින් ප්‍රාසාංගික ගීතයට ඇද තබා ගන්නට මෙල්බර්න් නුවර පදිංචි Spicy Swan අධිපතිනි නදී අබේරත්න නම් සොදුරු හිතැත්තිය ලාංකීක සුභාවිත සංගීතයට ඉටු කරන මෙහෙය අනුපමේයයි. එළඹෙන වසරේ (2018) පෙබරවාරි 03 දින මෙල්බර්න් බීසන් සෙන්ටර් වේදිකාව ආදරණීය හැන්දෑවක් බවට පත් කිරීමට ,මෙවර ලාංකීක තරු පිරිවරෙ තුන් ඈදුම් තරු මඩුල්ලක් පායන්නට නියමිතය .එ තාරකාවන් නමින් කුෂානි සදරේබා, රවීන් කණිෂ්ක සමග චිත්‍රාල් සෝමපාලය. ඔවුන් සුපුරුදු පරිදි මෙල්බර්න් වේදිකාවට කැදවන්නෙ Be My Valentine ප්‍රසංග සංවිධායිකා නදි අබේරත්නයන්මය.

2007 වසරේ කසුන් කල්හාරයන් මෙල්බන් කැදවීමේන් මෙල්බන් වේදිකාවේ පළමු අත්දැකීම ඔහුට ලබාදුන්නා සේම, කුෂානි සදරේබා හා රවීන් කණිෂ්කයන්ටද මෙල්බර්න් වේදිකාවේ පළමු අත්දැකීම ලැබෙන්නේ නදී අබේරත්නයන්ගේ ආරා ධනයෙන් වීමද තවත් සුවිශේෂීත්වයකි.

මේ සටහන සනිටුහන් වන්නේ සාර්ථක ප්‍රසංගයක් ඉදිරිපත් කිරීමට වෑයම් දරණ ඔවුන්ගේ දායකත්වය ප්‍රසංශාත්මකව ඇගැයීමට ලක් කරමින් එහි වින්දන රසය මෙල්බර්න් වාසී සියළුම හදවත් වලට එක් කිරීමටය.

Swan Entertainment විසින් ප්‍රාසාංගීක ගී අත්දැකීම් ඉදිරිපත් කිරීමට වේදිකා තැනිම අහඹුවකි. අහම්බයක් ලෙස රිගිං ටෝන් (ringing tone)එකකින් ඇසුණු ගීතයක භාවාත්මක හඩ පසු පස හඹා ගිය ඇය, ඒ ගීතයේ ස්වර හිමිකරු වු කසුන් කල්හාර නම් වු සොදුරු මිනිසාව සොයා ගනු ලබන්නේ තම මිතුරියකගෙ සහයෙනි. ඉන් පසු කසුන් කල්හාරයන්ගේ භාවාත්මක ගී රසයට හුරු වු ඇය ප්‍රථම වතාවට කසුන් කල්හාරයන් මෙල්බර්න් නුවරට කැදවා ප්‍රාසාංගීය අත්දැකීමක් මෙල්බර්න් රසික හදවත් වලට එකතු කරන්නේ 2007 වසරේ දීය . මුදලට වඩා වීනාවි සත්සර ගී දැහැන ප්‍රසංගයේ අරමුණ වෙනුවෙන් තම මානුෂික කලා හදවත අවදි කරන කසුන් කල්හාරයන් තම හඩ දායකත්වය සපයමින් මෙල්බර්න් වාසින් පිනවුයේය.

ඉන් පසු 2009/2011/2013/2014/2016 වසර තුළදි,සිංහල ගී තරු විටෙන් විට මෙල්බර්න් අහස ආලෝකමත් කරමින් සුභාවිත ගීතයට ඇලුම් කරන රසික පවුරක් ගොඩනගන්ට සමත් වු ඇය,,,ඇගේ නවතම ප්‍රසංගය වු Be My valentine සංවිධාන කටයුතු වලට අත පොවන්නේ, වෙන කවරදාටත් වඩා වෙනස් ආරයක ගීත අත්දැකීමක් ලබා දීමටය.වෙනස්ම වු ගීත ශෛලීන් වලින් සුවිශේෂී වු ඔවුන්ගේ ගී ස්වර ආන්දෝලත්මක ලෙස ඔවුනොවුන් පරයා මෙල්බර්න් අහසට ගිගුම් හඩ නංවන බවනම් නොඅනුමානය .

නමින් කුෂානි සදරේබා නම් වු ඇය, ශාස්ත්‍රීය සංගීතය හා නර්තනවේදයේ විශාරදවරියක මෙන්ම නාම අර්ථයේ පරිසමාප්තියෙන්ම සද කිරණක් සේම සුවිශේෂී හැකියාවන්ගෙන් පොහොණිව පායා දිලෙන්නියෙකි.කුඩා කල සිටම කලා භාෂණය තුළ හැදි වැඩෙන ඇයගේ ඝණ්ධාරාත්මක හඩ මුසුව, සංසන්දනය කල හැක්කෙක් නොවන්නේය. ඇයටම ආවේණික හඩ පරාසයකින් හා නර්තනයෙන් ඔබේ දෑස් මානයේ ගී ගයන්නට ඇගේ පැමි෴ම මෙල්බර්න් රසිකයින්ගේ භාගයයක් යැයි කීම අතිශෝක්තියක් නොවන්නේය.

ඒ අත්දැකීම වඩා තිව්‍ර කරමින් රසාස්වාදයේ අනන්තය සොයා යන්නට එක් වන රවීන් කණිෂ්ක නම් වු තාරුණ්‍යයේ තරු කුමරා ලෙස දෙවෙනි ඉනිම ටෙලි නාට්‍යයේ අනුහස් ලෙස තම රංගන දායකත්වය ලබා දෙමින් ජනප්‍රිය නළුවා ලෙස ජනතා සම්මානයට නිර්දේශීතව, එකිනෙකට වෙනස් වු අනන්‍යතාවයකින් , රංගනය , ගායනය හා නර්තනය යන ත්‍රිවිධ මාධ්‍යය තුළ එක සේ දස්කම් දක්වන්නට සමතෙකි. නව යොවුන් පරපුරක සිහින කුමරා ලෙස හදවත් නතු කරගන්නට සමත් වු ඔහුගේ භාවාත්මක හඩ,ප්‍රේමාන්විතව හදවත් ස්පර්ශ කරන බව නොඅනුමානය.

ගී ලොව ඉන්ද්‍රබීලයක් සේ නොසැලී , රොක් සංගීතය තුළින් ජාත්‍යන්තර වේදිකාව තම ග්‍රහණයට නතු කරගත්, ප්‍රවීණ ප්‍රතිභාපූර්ණ ගීතවේදි චිත්‍රාල් සෝමපාල නම් වු සංගීත වේදියා, වෙනස්ම ගී ආභාශයකින් නැවුම් අත්දැකීම් එක් කරමින් ප්‍රේක්ෂකාගාරම තම ග්‍රහණයට නතු කරගන්නට සමතෙකි .ඔහුගේ ගී ,කෞෂල්‍ය සෑමවිටම ඔහුටම ආවේනික ස්වරූපයකින් මෙල්බර්න් හදවත් ස්පර්ශ කරනු ඇත. ඒ ස්පර්ශ තුළ අමන්දානන්දයෙන් අප මුසපත් කිරිමට ,Be My Valentine වේදිකාව ඔහුගේ සුමුදු ස්පර්ශය බලාපොරොත්තුවෙන් සිටී.

එකිනෙකට වෙනස් වු ගී තාල රටා මැද තුන්පත් වියන් තනන තරු මිණෙත් පායන සොදුරු සැන්දෑවේ ,ගී රසයෙන් ඔබ අමන්දානන්දයට පමුණුවන්ට සේම තරු පිරූ දැතින් ඔබට පිදෙන සමරු තිළිණයද සොදුරු අත්දැකීමකි .

මේ සියලූ ගී ස්වර රටා මවන්නට දැ-



වැන්ත තාල සැපයුම මනා ලෙස ඉටු කරන්නේ ,අතිදක්ෂ සංගීත සැපයුම්වේදී දර්ශන අන්තෝනි ( දාස්) ප්‍රමුඛ TANTRA සංගීත කණ්ඩායමේ මනහර සංගීතයයි. අමා හා ටියා නර්තන කණ්ඩායම් වල වර්ණවත් වු නර්තන විලාශයද,UDDJS ආයතනයේ DJ වොරන් සහ තුරුනු නානායක්කාරගෙ ප්‍රතිභාත්මක ආලෝක හා වේදිකා අලංකරණ නව්‍යත්වයද ඊ෴ එහ ඒකැබඑසබැ ප්‍රාසාංගීක ගී අත්දැකීම තව තවත් වර්ණවත් කරනු ඇත.

පවුලේ ආදර෴ය අත්දැකීමක් ලෙස වයස් භේදයකින් තොරව ගී රස විදිය හැකි නවතම ගී රසාස්වාදනයට ,Huntingdale Spicy Swan ලවෙතින් අනුග්‍රහක දායකත්වය සපයන අතර ,හැමදාමත් ප්‍රේක්ෂකයා මුදුන් පත් කරමින් අනර්ඝ පාරිභෝගික සේවාවක් සපයන Aus news lanka වෙබ් අඩවිය තුලින්,ප්‍රවේශ පත්‍ර නිකුත් කිරිම සිදුකරයි. සහොදර දෑත් සමුහයකගේ ප්‍රයත්නයක් වන Be My Valentine සීමිත ප්‍රවේශ පත්‍ර ගොන්නෙන් ඔබගේ ඉඩහසර වෙන් කරගනිමින් ඒ ආනන්දනීය රත්‍රීයේ නැවුම් අත්දැකීමෙන් අමන්දානන්දයට පත් වන්නට Swan Entertainment සහෘද රසික රසිකාවියන්ට ආරාධනා කර සිටී.

සටහන
ප්‍රජිත් නිලුකා